සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
புத்த சாசனம், சமய மற்றும் கலாச்சார அலுவல்கள், தேசிய ஒருமைப்பாடு,சமூக பாதுகாப்பு மற்றும் ஊடகத்துறை அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs , National Integration , Social Security and Mass Media

මගේ අංකය / எனது இல DSD/Ho/05/MF/08/01/චක්‍ර ලේඛණ
ඔබේ අංකය / உமது இல / Your No ..........
දිනය / திகதி / Date 2024.10.29

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2020/22 ට පළමු එකතුව

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති/ සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්.

## 2021අයවැය යෝජනා යටතේ හදුන්වාදෙන " නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය" යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම

### උපරිම ණය මුදල් සීමාව ඉහල නැංවීම

**01.** නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් ලබාගෙන සාර්ථක වූ ආදායම් උත්පාදන ව්‍යාපෘතින් තවදුරටත් දියුණු කිරිමට බැංකු සමාජිකයින්ට අවශ්‍ය මුදල් ලබාදීමට හැකි වන පරිදි ණය මුදල් සිමාව ඉහල නැංවිමට සමෘද්ධි බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.
ඒ අනුව, නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ මුදාහල හැකි උපරිම ණය සීමාවන් ඉහල නැංවිම හා ඊට අදාල කොන්දේසි හදුන්වාදීම සඳහා මෙම නව එකතුව නිකුත් කරන බව දන්වමි.

**02.** බැංකු සමිති මගින්, නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය වැඩසටහන යටතේ ලබාදෙන උපරිම ණය සීමාව පහත පරිදි සංශෝධනය කිරිම

I. හදුනාගත් විශේෂිත වු ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා පමනක් ණය සීමාව 5,000,000 දක්වා වැඩි කෙරේ.

II. මෙම ව්‍යාපෘතින් සඳහා බැංකු සමිතිය විසින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතුය.

III. සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව බැංකු සමිති කළමණාකරු හා දිස්ත්‍රික් අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ක්ෂුද්‍ර මුල්‍ය අංශයට යොමු කර, ක්ෂුද්‍ර මුල්‍ය අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වේ.

IV. ඉන් අනතුරුව, ක්ෂුද්‍ර මුල්‍ය අධ්‍යක්ෂගේ අනුමැතිය සහිත ලිපිය සමඟ ණය ඉල්ලුම් පත්‍රය විධායක කමිටුව ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන , ණය මුදල නිදහස් කළ යුතුය.

v. ව්‍යාපෘතියේ ශක්‍යතාවය, රැකියා උත්පාදනය,බැංකු/බැංකු සමිති වලින් ලබාගත් ණය මුදල් ආපසු ගෙවිම,ණය ආපසු ගෙවිමට ඇති හැකියාව වැනි කාරණාවන් පිළිබඳ සොයා බලා එවැනි කරුණු

පිළිබඳ සෑහීමට පත්විය හැකි ආදායම් උත්පාදන ව්‍යාපෘති පමණක් තෝරාගෙන ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය.

03.සමෘද්ධි බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන නව සමෘද්ධි ව්‍යවසාය සංවර්ධන ණය වැඩසටහන යටතේ ලබාදෙන උපරිම ණය මුදල රු.2,000,000 දක්වා වැඩි කරන බව දන්වමි.

04 සමෘද්ධි බැංකුව විසින් ඉහත ජේද අංක 03 අවසරය මත රු. මිලියන 01 වඩා ණය ඉල්ලීම සඳහා ද ව්‍යාපෘති වාර්තාව සකස් කර, සමෘද්ධි බැංකු සමිතියට ඉදිරිපත් කර ව්‍යාපෘතියට අනුමැතිය ලබාගත යුතුය. ඉන් අනතුරුව ණය මුදලට අනුමැතිය පාලක මණ්ඩලයෙන් ලබාගෙන ණය මුදල නිකුත් කළ යුතුය.

04.මෙම උපදෙස් , චක්‍රලේඛය නිකුත් කල දින සිට වලංගු වේ.

05.මෙම නව එකතුව මෙපමණ වන අතර, අනිකුත් උපදෙස් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2020/22 තවදුරටත් වලංගු කර ගත යුතුය.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01 ලේකම්- බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
02 දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- කා.දැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04 දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
05. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
06. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
07 සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.